# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 72 දරන
# සමඵ මණ්ඩල පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

**මිළ : රු. 1.50 යි** **තැපැල් ගාස්තුව : රු. 1.15 යි**

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 3/86

**අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන ප්‍රදේශවල සමථ මණ්ඩල පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඒ මණ්ඩලවල බලතල සහ කාර්ය නිශ්චිතව දැක්වීම පිණිස ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (1) (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තන් පස් දෙනකුගෙන් සමන්විත කොමිෂන් සභාවක් ජනාධිපතිවරයා විසින් පත් කරන ලැබිය යුතු අතර, ඒ තැනැත්තන්ගෙන් යටත් පිරිසෙයින් තුන්දෙනකු ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ අධිකරණ ධුර දැරූ තැනැත්තන් අතුරින් විය යුතු ය. ජනාධිපතිවරයා විසින්, ඒ ඉහත කී අධිකරණ ධුර දැරූ සාමාජිකයන් තුන්දෙනාගෙන් එක් අයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය. **කොමිෂන් සභාව පත් කිරීම.**

(2) සභාපතිවරයා සහ කොමසාරිස්වරු ඔවුන්ගෙන් යම් අයකු කලින් මරණයට පත් වූයේ නම්, ඉල්ලා අස්වූයේ නම් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නම් මිස, අවුරුදු තුනක කාලයක් ධුර දැරිය යුතු ය :

එසේ වුව ද, සභාපතිවරයාගේ හෝ කොමසාරිස්වරුන්ගේ ධුර කාලය අවසන්වීමෙන් පසු කොමිෂන් සභාවේ අළුත් සාමාජිකයන් පත් කරනු ලැබ නැති නම් එසේ ධුර අවසන් වන දිනයට පෙරාතු වම දිනයේ ධුරය දරමින් සිටි සභාපතිවරයා සහ කොමසාරිස්වරු, අළුත් සාමාජිකයන් පත් කරනු ලබන තුරු අඛණ්ඩව ධුර දැරිය යුතු ය.

(3) සිය ධුර කාලය අවසන්වීමේ දී ධුරය හිස් කරන සභාපතිවරයා හෝ යම් කොමසාරිස්වරයෙක් හෝ නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(4) (අ) සභාපතිවරයාට හෝ යම් කොමසාරිස්වරයකුට ජනාධිපතිවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

2—ඩී 001701—7,635 (88/10)

(ආ) ජනාධිපතිවරයා විසින් හේතු දැක්වීමක් නොමැතිව, සභාපතිවරයා හෝ යම් කොමසාරිස්වරයකු හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සභාපතිවරයා හෝ යම් කොමසාරිස්වරයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය.

(6) (අ) සභාපතිවරයාගේ හෝ යම් කොමසාරිස්වරයකුගේ මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම හේතු කොටගෙන කොමිෂන් සභාවේ යම් පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක, (1) වන උපවගන්තියේ විධිවිධාන ගැන සැලකිලිමත්ව ජනාධිපතිවරයා විසින් ඒ පුරප්පාඩුව පුරවනු ලැබිය යුතු ය.

(ආ) සභාපතිවරයාගේ හෝ යම් කොමසාරිස්වරයෙකුගේ මරණය ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ඇති වන පුරප්පාඩුවක් පිරවීම පිණිස පත් කරනු ලබන යම් තැනැත්තකු විසින් සිය පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(7) රෝගාතුරවීමේ හෝ වෙනත් අබලතාවක හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන් තම ධුරයේ කාර්ය ඉටු කිරීමට කොමසාරිස්වරයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ නොහැකියාවේ හෝ බැහැරව සිටීමේ කාලය තුළ ඔහු වෙනුවට ක්‍රියා කිරීමට සුදුසු තැනැත්තකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි අතර, එසේ නොහැකියාවට පත් වූ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින්නා වූ හෝ කොමසාරිස්වරයා සභාපතිවරයා වූ අවස්ථාවක, කොමිෂන් සභාවේ සභාපතිවරයා නැවත කාර්ය භාර ගන්නා තෙක්, ඔහු වෙනුවට ක්‍රියා කිරීමට ජනාධිපතිවරයා විසින් කලින් අධිකාරණ ධුරය දැරූ වෙනත් කොමසාරිස්වරයකු පත් කරනු ලැබිය යුතු ය.

(8) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලබන ආකාරය හා අනුප්‍රමාණ අනුව සභාපතිවරයාට හා කොමසාරිස්වරුන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(9) කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණපූරණය සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයන් තුන්දෙනකු සිටිය යුතු අතර, කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය සභාපතිවරයා විසින් දැරිය යුතු ය. කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ රැස්වීම සහ ඒ රැස්වීම්වල දී කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(10) කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ යම් කොමසාරිස්වරයෙකු ගේ පත්වීම පිළිබඳ යම් දෝෂයක් තිබීම පමණක් හේතු කොට ගෙන කොමිෂන් සභාවේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වේ යැයි සලකනු නොලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ බලතල සහ කාර්ය.

3. කොමිෂන් සභාව විසින්—

(අ) මේ පනතේ කාර්ය සඳහා සමථකාරවරුන් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම ද ;

(ආ) සමථකාරවරුන් විසින් මේ පනත යටතේ තම කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම ද ;

(ඇ) ඒ සමථකාරවරුන් වෙත අවශ්‍ය විය හැකි විධාන නිකුත් කිරීම ද

කරනු ලැබිය යුතු ය.

සමථ මණ්ඩල ප්‍රදේශ.

4. කලින් කල ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු (මෙහි මින්මතු " සමථ මණ්ඩල ප්‍රදේශය " යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රදේශය හෝ ප්‍රදේශ සඳහන් කළ යුතු ය.

සමථකාර වරුන්ගේ මූල මණ්ඩලය පත් කිරීම.

5. (1) සමථ මණ්ඩල ප්‍රදේශයක් සම්බන්ධයෙන් 4 වන වගන්තිය යටතේ නියමයක් පළ කරනු ලැබීමෙන් පසු, කොමිෂන් සභාව විසින් ඒ ප්‍රදේශය සඳහා (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන් අතුරින් සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයක් සහ එහි සභාපතිවරයා පත් කිරීම පිණිස අවශ්‍ය සියලු පියවර මේ පනතේ පළමුවන උපලේඛනයෙහි දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව ගත යුතු ය.

(2) යම් සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයකට පත් කරනු ලැබීමට යෝග්‍ය තැනැත්තෝ සුදුසු වන්නාහ :—

(අ) සමථ මණ්ඩල ප්‍රදේශයක පදිංචිව සිටින හෝ ඒ ප්‍රදේශයේ යම් වැඩක යෙදී සිටින යම් තැනැත්තෙක් ;

(ආ) අතිවිශේෂ අවස්ථාගත කරුණුවල දී සුදුසු යයි කොමිෂන් සභාව තීරණය කරන්නේ නම්, ඒ සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත පදිංචිව සිටින හෝ ඒ ප්‍රදේශයෙන් පිටත යම් වැඩක යෙදී සිටින යම් තැනැත්තෙක් ; සහ

(ඇ) ඒ සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටියේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත ද ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් නම් කරනු ලබන යම් රජයේ නිලධරයෙක් :

එසේ වුව ද, මේ ඡේදය යටතේ නම් කරනු ලබන නිලධරයෙක්, එම පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත වූ සෑම සමථ මණ්ඩල ප්‍රදේශයක්ම සඳහා පත් කරනු ලබන මූල මණ්ඩලයට පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

සමථ මණ්ඩලවල බලතල.

6. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ යම් සමථ මණ්ඩල ප්‍රදේශයක් තුළ උද්ගත වූ යම් ආරාවුලක් හෝ මේ පනතේ දෙවන උපලේඛනයෙහි සඳහන් වන්නා වූ ද, ඒ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ කරන ලදැයි කියනු ලබන්නා වූ ද යම් වරදක් සමථ කිරීම මගින් නිරවුල් කිරීම සඳහා යම් තැනැත්තකු විසින් ඒ සමථ මණ්ඩල ප්‍රදේශයේ මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, ඒ ආරාවුල—

(අ) චංචල හෝ නිශ්චල දේපළක් සම්බන්ධයෙන් වන විට, ඒ චංචල හෝ නිශ්චල දේපළ තබාගෙන ඇත්තේ හෝ පිහිටියේ යම් සමථ මණ්ඩල ප්‍රදේශයක් ඇතුළත ද ඒ සමථ මණ්ඩල ප්‍රදේශය සඳහා පත් කරන ලද මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉල්ලීම කරනු ලැබිය යුතු ය;

(ආ) ගිවිසුමක් සම්බන්ධයෙන් වන විට, ඒ ගිවිසුම ඇති කරන ලද්දේ යම් සමථ මණ්ඩල ප්‍රදේශයක් ඇතුළත ද, ඒ සමථ මණ්ඩල ප්‍රදේශය සඳහා පත් කරන ලද මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉල්ලීම කරනු ලැබිය යුතු ය; තව ද

(ඇ) අධිකරණයක නඩු නිමිත්තක් සංයුක්ත වන කරුණක් සම්බන්ධයෙන් වන විට, ඒ නඩුව සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති අධිකරණයේ අධිකරණ බල ප්‍රදේශ සීමාව තුළ වූ ප්‍රදේශය සඳහා පත් කරන ලද මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉල්ලීම කරනු ලැබිය යුතු ය.

(2) ආරාවුල්කරුවන්ගෙන් එක් අයකු—

(අ) රජය ; හෝ

(ආ) ආරාවුල යම් දේපළක්, මුදලක් හෝ වෙනත් අයවිය යුතු කිසිවක් අයකර ගැනීමට අදාළ වූ අවස්ථාවක, රජයේ නිලධරයකුගේ තත්ත්වයෙන් ක්‍රියා කරන රජයේ නිලධරයකු ; හෝ

(ඇ) වරද, ඒ වරද සම්බන්ධයෙන් නඩු පැවරීම නීතිපතිවරයා විසින් කරනු ලබන අවස්ථාවක, නීතිපතිවරයා හෝ

වේ නම් (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන කිසිම ඉල්ලීමක් මූල මණ්ඩලයක සභාපතිවරයා විසින් භාරගනු නොලැබිය යුතු ය.

(3) සෑම ඉල්ලීමක් ම, නියමිත ගාස්තුව නියමිත ආකාරයෙන් ගෙවා ඇති බවට සාක්ෂියක් වන ලියවිල්ලක් සමග, ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

යම් තාවකාලික ප්‍රතිකර්මයක් පවරනු ලැබිය හැකි වන නඩු හැර වෙනත් නඩු නිරවුල් නොකිරීමේ සහතිකය නොමැතිව නොපවරනු ලැබිය යුතු බව.

**7.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සමථ මණ්ඩල ප්‍රදේශයක් සඳහා මූල මණ්ඩලයක් පත් කරනු ලැබ ඇති අවස්ථාවක, සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් හෝ ඒ ප්‍රදේශය තුළ පැන නගින යම් ආරාවුලක් හෝ ප්‍රදේශය තුළ කරන ලදැයි කියනු ලබන වරදක් හෝ සම්බන්ධයෙන් වන නඩු කටයුත්තක්—

(අ) ඒ ආරාවුල, වටිනාකම රුපියල් විසිපන්දහස නොඉක්මවන චංචල හෝ නිශ්චල දේපළක් හෝ ණයක්, අලාභයක් හෝ ඉල්ලීමක් සම්බන්ධයෙන් වූ ආරාවුලක් නම්; හෝ

(ආ) ඒ ආරාවුල, මේ පනතේ තුන්වන උපලේඛනයෙහි සඳහන් නඩුවක් පිළිබඳව නොවන්නා වූ අධිකරණ නඩු නිමිත්තක් ඇති කරන ආරාවුලක් නම්; හෝ

(ඇ) ඒ වරද, මේ පනතේ දෙවන උපලේඛනයෙහි සඳහන් වරදක් නම්

ඒ නඩුව පවරන තැනැත්තා විසින්, 12 වන වගන්තියේ හෝ 14(2) වන වගන්තියේ සඳහන් නිරවුල් නොකිරීමේ සහතිකය ඉදිරිපත් කරනු ලැබුවහොත් හැර, යම් මුල් අවස්ථා අධිකරණයක පැවරීම හෝ එවැනි අධිකරණයක් විසින් භාර ගැනීම හෝ නොකරනු ලැබිය යුතු ය:

එසේ වුවද, එවැනි යම් ආරාවුලක් සම්බන්ධයෙන් වූ නඩුවක අයැද සිටින සහනයෙහි, සිවිල් නඩුවිධාන සංග්‍රහයේ V වන කොටස යටතේ වූ යම් තාවකාලික ප්‍රතිකර්මයක් ප්‍රදානය කිරීම සඳහා වන අයැදුමක් ද අඩංගු වන අවස්ථාවක හෝ 6 වන වගන්තිය යටතේ යම් ආරාවුලක් සම්බන්ධයෙන් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇති විටෙක, ඒ ආරාවුල සම්බන්ධ ආරාවුල්කරුවකු විසින් පසුව සිවිල් නඩු විධාන සංග්‍රහයේ V වන කොටස යටතේ වූ තාවකාලික ප්‍රතිකර්මයක් සඳහා වන අයැදුමක් ද ඇතුළත් වන ලෙස ඒ ආරාවුල සම්බන්ධයෙන් යම් අධිකරණයක නඩුවක් පවරනු ලැබ ඇති අවස්ථාවක, ඒ තාවකාලික ප්‍රතිකර්මය දීමට අදාළ වන ප්‍රමාණයට පමණක් ඒ නඩුව භාර ගැනීම සහ තීරණය කිරීම අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය. ඒ තීරණය කිරීමෙන් පසුව අධිකරණය විසින්—

(අ) ඒ අධිකරණය ඉදිරියෙහි වූ නඩු නිමිත්ත සංයුක්ත කරන ආරාවුල සම්බන්ධයෙන් 6 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබ නොමැති අවස්ථාවක, ඒ ආරාවුල සමථ කිරීම සඳහා නිසි මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය; තවද

(ආ) ඒ ආරාවුල සම්බන්ධයෙන් 6 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ආරාවුල සමථ කිරීම කරගෙන යන ලෙස අවස්ථාවෝචිත පරිදි ඒ වන විටත් මණ්ඩලයක් පත් කරනු ලැබ නොමැති නම් නිසි මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත හෝ නිසි මණ්ඩලය වෙත හෝ විධාන කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කිසිවක් ආරාවුල් කරුවන්ගෙන් එක් අයකු රජය වන ආරාවුලක් සම්බන්ධයෙන් හෝ යම් දේපළක්, මුදලක් හෝ වෙනත් අයවිය යුතු එක් රජයේ නිලධරයකුගේ තත්ත්වයෙන් ක්‍රියා කරන රජයේ නිලධරයකු විසින් අයකර ගැනීමට අදාළ වූ ආරාවුලක් සම්බන්ධයෙන් වූ යම් සිවිල් නඩු කටයුත්තකට හෝ නීතිපතිවරයා විසින් යම් දක් සම්බන්ධයෙන් නඩු පවරනු ලබන අවස්ථාවක, ඒ වරදට හෝ අදාළ නොවිය යුතු ය.

අධිකරණය විසින් යොමු කිරීම.

8. සමථ මණ්ඩල ප්‍රදේශයක් කෙරෙහි අධිකරණ බලය ඇති සිවිල් අධිකරණයක යම් ආරාවුලක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබ ඇති අවස්ථාවක, ඒ අධිකරණය විසින්, පාර්ශ්වකරුවන්ගේ ලිඛිත කැමැත්ත ඇතිව, එ ආරාවුල සමථ කිරීමෙන් නිරවුල් කිරීම පිණිස ඒ ප්‍රදේශය සඳහා පත්කරන ලද මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමු කරනු ලැබිය හැකි ය.

සමථ මණ්ඩල පිහිටුවීම.

9. (1) සමථ මණ්ඩල ප්‍රදේශයක් සඳහා පත් කරන ලද මූල මණ්ඩලයක සභාපතිවරයා විසින් 6 වන වගන්තිය යටතේ වූ ඉල්ලීමක් ලැබුණු විට හෝ 7 වන හෝ 8 වන වගන්තිය යටතේ තම වෙත යොමු කිරීමක් කරනු ලැබූ විට, ඒ සමථ මණ්ඩල ප්‍රදේශය සඳහා පත් කරන ලද මූල මණ්ඩලයෙන්—

(අ) එක් එක් ආරාවුල් කරු විසින් තෝරා ගනු ලබන එක් එක් සාමාජිකයකුගෙන් ; සහ

(ආ) (අ) ඡේදය යටතේ තෝරා ගන්නා ලද සාමාජිකයන් විසින් තෝරා ගනු ලබන එක් සාමාජිකයකුගෙන්

සමන්විත (මෙහි මින් මතු “මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) සමථ මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය:

එසේ වුවද (අ) ඡේදයේ සඳහන් ආරාවුල් කරුවන්ට හෝ (ආ) ඡේදයේ සඳහන් සාමාජිකයන්ට ඔවුන්ගේ ඒ ඒ තේරීම් ගැන එකඟත්වයකට පැමිණීමට නොහැකි වන අවස්ථාවක, මූල මණ්ඩලයේ සභාපතිවරයා විසින් අවශ්‍ය තේරීම් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ තෝරාගන්නා ලද සාමාජිකයා (මෙහි මින් මතු “ප්‍රධාන සමථකාරවරයා” යනුවෙන් හඳුන්වනු ලබන) මණ්ඩලයේ ප්‍රධාන සමථකාරවරයා ලෙස ක්‍රියා කළ යුතු ය;

එසේ වුවද මූල මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තෝරා ගන්නා ලද අවස්ථාවක, ඒ සභාපතිවරයා ප්‍රධාන සමථකාරවරයා ලෙස ක්‍රියා කළ යුතු ය.

(3) මණ්ඩලය පිහිටුවීමෙන් පසු, ඉල්ලීමට හෝ යොමු කිරීමට අදාළ ආරාවුල යෝ වරද මූල මණ්ඩලයේ සභාපතිවරයා විසින්, සමථ කිරීමෙන් නිරවුල් කිරීම සඳහා ඒ මණ්ඩලය වෙත යොමු කළ යුතු ය.

සමථ මණ්ඩලයේ කාර්ය.

**10.** 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ යම් මණ්ඩලයකට වෙත යම් ආරාවුලක් හෝ වරදක් යොමු කරනු ලැබූ අවස්ථාවක, නීත්‍යානුකූල මාර්ගවලින් ආරාවුල් කරුවන් අතර සුහද නිරවුල් කිරීමක් ඇති කිරීම පිණිස උත්සාහ කිරීම ද, ඔවුන්ගේ සැමුත්ත ඇතිව සහ ක්‍රියාත්මක කළ හැකි සෑම අවස්ථාවක දී ම, ඒ ආරාවුල හෝ වරද නැවත සිදුවීම වැළැක්වීම පිණිස ඔවුන්ගේ හැසිරීම් ගැනවිල්ලේ නියම හේතුව ඉවත් කිරීම ද ඒ මණ්ඩලයේ කාර්යය වන අතර, මේ සඳහා මණ්ඩලය විසින්—

(අ) දන්වනු ලබන වේලාවක සහ ස්ථානයක පැවැත්වෙන සාමදා කිරීමේ සාකච්ඡාවකට එක්ව හෝ වෙන් වෙන්ව පැමිණ සිටින ලෙස ආරාවුල් කරුවන්ට සහ අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන වෙනත් තැනැත්තන්ට දැනුම් දීම ;

(ආ) ආරාවුල් කරුවන් අතර නිරවුල් කිරීමක් ඇති කර ගැනීමට ආධාර විය හැකි යම් සාක්ෂිකරුවන් කැඳවා හෝ ලිය කියවිලි රැගෙන ඒ සාකච්ඡාවට එන මෙන් එසේ පැමිණ සිටින ලෙස දන්වන ලද යම් තැනැත්තකුට නියම කිරීම ;

(ඇ) නිරවුල් කිරීමක් ඇති කිරීම සඳහා අවශ්‍ය වන තරම් එවැනි සමථ කිරීමේ සාකච්ඡා ගණනාවක් කැඳවීම ;

(ඈ) 13 වන වගන්තියේ සඳහන් කාල සීමාව ඇතුළත නම් කටයුතු සම්පූර්ණ කිරීම සහ එසේ කිරීමට නොහැකි වූ විට, ඒ ආරාවුල හෝ වරද නිරවුල් කිරීමට නොහැකි වූ බව සඳහන් කරමින් ප්‍රධාන සමථකාරවරයා විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියේ වූ නිරවුල් නොකිරීමේ සහතිකයක් නිකුත් කිරීම

කරනු ලැබිය යුතු ය.

නිරවුල් කිරීමක් ඇති කරන ලද අවස්ථාවක.

**11.** (1) ආරාවුල් කරුවන් නිරවුල් කිරීමකට එකඟ වූ අවස්ථාවක, නිරවුල් කිරීම පිළිබඳ නියමයන් ලේඛනගත කළ යුතු අතර ප්‍රධාන සමථකාරවරයා විසින් සහ ආරාවුල් කරුවන් විසින් ඊට අත්සන් කරනු ලැබිය යුතු ය ; තව ද මණ්ඩලය විසින් —

(අ) ඒ නිරවුල් කිරීම, 6 වන වගන්තිය යටතේ ඉල්ලීමක් මගින් මණ්ඩලය ඉදිරියට ගෙනෙන ලද යම් ආරාවුලක් හෝ වරදක් සම්බන්ධයෙන් වූ නිරවුල් කිරීමක් වන අවස්ථාවක, එහි පිටපත බැගින් එක් එක් ආරාවුල් කරුට වහාම නිකුත් කරනු ලැබිය යුතු ය ; තව ද

(ආ) ඒ නිරවුල් කිරීම, 7 වන වගන්තිය හෝ 8 වන වගන්තිය යටතේ අධිකරණය විසින් යොමු කරන ලද යම් ආරාවුලක් සම්බන්ධයෙන් වූ නිරවුල් කිරීමක් වන අවස්ථාවක, එහි පිටපතක් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) නිරවුල් කිරීමේ පිටපතක් (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින් ආරාවුල්කරුවන්ට දැනුම්දීමෙන් පසුව, ඒ නිරවුල් කිරීම අනුව තීන්දු ප්‍රකාශයක් සටහන් කරනු ලැබිය යුතු ය.

**නිරවුල් කිරීමක් කළ නොහැකි අවස්ථාවක.**

12. ආරාවුල්කරුවන් නිරවුල් කිරීමකට එකඟ නොවූ අවස්ථාවක, මණ්ඩලය විසින්—

(අ) 6 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් මත මණ්ඩලය වෙත යොමු කරන ලද ආරාවුලක් හෝ වරදක් සම්බන්ධයෙන් වන විට, ඒ ආරාවුල හෝ වරද ඒ මණ්ඩලය වෙත යොමු කරනු ලැබූ බවත්, සමථ කිරීමෙන් ඒ ආරාවුල හෝ වරද නිරවුල් කිරීමට නොහැකි බවත් ප්‍රකාශ කරමින් ප්‍රධාන සමථකාරවරයා විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියෙහි වූ නිරවුල් නොකිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය; නැතහොත්

(ආ) 7 වන වගන්තිය හෝ 8 වන වගන්තිය යටතේ නිරවුල් කිරීම සඳහා යම් අධිකරණයක් විසින් යොමු කරන ලද ආරාවුලක් සම්බන්ධයෙන් වන විට, ආරාවුල සමථ කිරීමෙන් නිරවුල් කිරීමට නොහැකි බව, ප්‍රධාන සමථකාරවරයාගේ අත්සනින් යුතු ව නියමිත ආකෘතියෙහි වූ වාර්තාවක් ඒ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**මණ්ඩලය ක්‍රියා කළ යුතු කාල සීමාව.**

13. සමථ කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මණ්ඩලය ඉදිරියේ ඇති සෑම ආරාවුලක් ම හෝ වරදක් ම සම්බන්ධයෙන්, ඒ මණ්ඩලය සංස්ථාපනය කරනු ලැබීමෙන් දින තිහක් ඇතුළත ඒ මණ්ඩලය විසින් 11 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි හෝ 12 වන වගන්තියෙහි සඳහන් පියවර ගත යුතු ය.

**නිරවුල් කිරීම අනුව ක්‍රියා නොකිරීම හෝ එය උල්ලංඝනය කිරීම.**

14. (1) 6 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් අනුව සමථ මණ්ඩලයකට යොමු කරන ලද යම් ආරාවුලක් හෝ වරදක් නිරවුල් කරනු ලැබූ කල්හි, ආරාවුල්කරුවන් අතුරින් එක් තැනැත්තකු විසින් යම් වේලාවක නිරවුල් කිරීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා නොකරනු ලැබූ හෝ ඒවා උල්ලංඝනය කරනු ලැබූ අවස්ථාවක, එසේ ක්‍රියා නොකිරීම හෝ ඒ උල්ලංඝනය කිරීම අනෙක් පාර්ශ්වකරු විසින් වහාම මණ්ඩලය වෙත වාර්තා කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වාර්තාවක් ලැබුණු පසු, මණ්ඩලය විසින් දන්වනු ලබන වේලාවක සහ ස්ථානයකට පැමිණෙන ලෙස ආරාවුල්කරුවන්ට සහ අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් තැනැත්තන්ට දැනුම් දිය යුතු අතර. ඔවුන් අතර පැන නැගී තිබිය හැකි යම් මතභේද විසඳාලීමට උත්සාහ ගත යුතු ය; තව ද අළුත් නිරවුල් කිරීමක් ඇති කර ගැනීමෙහි ලා ඔවුන්ට සහාය විය යුතු ය. එවැනි මතභේද විසඳිය නොහැකි අවස්ථාවක, ඒ ආරාවුල හෝ වරද නිරවුල් කිරීමට නොහැකි වූ බව සඳහන් කරමින්, ප්‍රධාන සමථකාරවරයා විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියේ වූ නිරවුල් නොකිරීමේ සහතිකයක් මණ්ඩලය විසින් නිකුත් කළ යුතු ය.

නියෝජනය.

**15.** මණ්ඩලයක් ඉදිරියෙහි වූ යම් කාරණයක දී යම් ආරාවුල්කරුවකු වෙනුවෙන් පෙනී සිටීමට නීතිඥවරයකුට හෝ අනුයෝජිතයකුට හෝ වෙනත් තැනැත්තකුට හිමිකමක් නොතිබිය යුතු අතර, ඒ සඳහා අවසර නොදිය යුතු ය :

එසේ වුවද, මණ්ඩලයක් ඉදිරියෙහි—

(අ) එක් කලත්‍රයකු විසින් අනෙක් කලත්‍රයා ; හෝ

(ආ) තම මව හෝ පියා හෝ භාරකරු හෝ දේපළ ආරක්ෂක විසින් බාලවයස්කරුවකු හෝ යම් අබලතාවකින් යුත් වෙනත් තැනැත්තකු

නියෝජනය කරනු ලැබීමට අවසර දිය යුතු ය.

සාක්ෂිකරුවන් සතු වරප්‍රසාද.

**16.** (1) අධිකරණයක් ඉදිරියෙහි සාක්ෂි දෙන සාක්ෂිකරුවකුට ඒ සාක්ෂි සම්බන්ධයෙන් හිමි වන සියලු වරප්‍රසාද, සමථ මණ්ඩලයක් ඉදිරියෙහි ප්‍රකාශයක් කරන සෑම තැනැත්තකුට ම ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් හිමි විය යුතු ය.

(2) සමථ මණ්ඩලයක් ඉදිරියෙහි යම් තැනැත්තකු විසින් කරන ලද කිසිම ප්‍රකාශයක් යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ආධේශය නොකරනු ලැබිය යුතු ය.

කාලාපගමනය.

**17.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැණිව කුමක් සඳහන් වී තිබුණ ද යම් නඩු නිමිත්තක් හෝ වරදක් සම්බන්ධයෙන් කාලාපගමන කාලසීමාව ආගණනය කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි, ඒ නඩු නිමිත්ත සංයුක්ත කරන ආරාවුල හෝ ඒ වරද සම්බන්ධයෙන්, සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයක සභාපතිවරයා වෙත ඉල්ලීමක් කරන ලද දිනයෙන් ආරම්භ ව, ඒ ආරාවුල හෝ වරද සම්බන්ධයෙන් 12 වන වගන්තිය හෝ 14(2) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සහතිකයේ දිනයෙන් අවසන් වන කාල සීමාව සැලකිල්ලට නොගත යුතු ය.

සමථ මණ්ඩලයක් විසින් නිරවුල් කරන ලද වරදක් සමථය කරන ලද සේ සැලකිය යුතු බව.

**18.** සමථ මණ්ඩලයක් විසින් මේ පනතේ දෙවන උපලේඛනයෙහි සඳහන් යම් වරදක් නිරවුල් කරන ලද අවස්ථාවක, ඒ වරද 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා සමථය කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ග්‍රාම සේවා නිලධරයන් මණ්ඩලයට සහාය විය යුතු බව.

**19.** යම් මණ්ඩලයක් විසින්, 10 වන වගන්තියේ (අ) ඡේදය යටතේ සහ 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ තම කාර්ය කරගෙන යාමේ දී, ආරාවුල්කරුවකුට හෝ වෙනත් තැනැත්තකුට යම් දැනුම් දීමක් කිරීම පිණිස තම සහාය දෙන ලෙස සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසය සඳහා පත් කරන ලද යම් ග්‍රාම සේවා නිලධරයකුට නියම කරනු ලැබිය හැකි අතර, එසේ නියම කරනු ලැබූ කල්හි ඒ ග්‍රාම සේවා නිලධරයා විසින් ඒ මණ්ඩලයට ඒ පිළිබඳව අවශ්‍ය සියලු සහාය දිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

20. මේ පනත යටතේ පිහිටුවනු ලබන සෑම මණ්ඩලයක ම සාමාජිකයන් ඔවුන් ඒ සාමාජිකයන් ලෙස ක්‍රියා කරන තාක් කල් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය ; තවද ඒ මණ්ඩලය ඉදිරියෙහි පවත්වෙන සෑම කටයුත්තක් ම ඒ නීති සංග්‍රහයේ අර්ථානුකූලව අධිකරණ කටයුත්තක් ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

21. මේ පනත යටතේ පිහිටුවනු ලබන සෑම මණ්ඩලයක් ම අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

මණ්ඩලය පිහිටුවීමෙහිලා වූ දෝෂයක් නිසා එහි ක්‍රියා සහ කටයුතු අවලංගු නොවිය යුතු බව.

22. මණ්ඩලයක් පිහිටුවීමෙහි ලා වූ දෝෂයක් පමණක් හේතු කොට ගෙන මණ්ඩලයේ ක්‍රියාවක් හෝ එහි කටයුතු හෝ අවලංගු නොවන බව සැලකිය යුතු ය.

නියෝග.

23. (1) යම් කරුණු ගැන නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති විටෙක, ඒ කරුණු සම්බන්ධයෙන් හෝ නියමිත කරුණු ලෙස මේ පනතෙහි සඳහන් යම් කරුණු සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ පළ කිරීමේ දින සිට හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු හැකි තාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තව ද එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද ලෙස සැලකිය යුතු ය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලද දිනය ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

24. මේ පනතෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,—

"ආරාවුල් කරු" යන්නෙන්, ආරාවුලක පාර්ශ්වකරුවකු හෝ කරන ලදැයි කියැවෙන වරදක් කිරීමෙහි ලා සම්බන්ධ වූ යම් තැනැත්තකු හෝ යම් වරදක් කරන ලද්දේ යයි කියනු ලබන්නේ යම් තැනැත්තකුට විරුද්ධව ද එවැනි තැනැත්තකු හෝ අදහස් වේ.

## පළමුවන උපලේඛනය

### සමථකාරවරුන්ගේ මූල මණ්ඩලය පත් කිරීම

(5(1) වන වගන්තිය)

1. සමථ මණ්ඩල ප්‍රදේශයක් සඳහා මූල මණ්ඩලයක් පත් කිරීමට ඇති අවස්ථාවක හෝ යම් අතිරේක පත් කිරීමක් කිරීමේ හෝ යම් පුරප්පාඩුවක් පිරවීමේ හෝ අවශ්‍යතාව ඇති වන අවස්ථාවක, කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන, දේශපාලන ස්වභාවයෙන් තොර, තැනැත්තන්ගෙන්, මණ්ඩලවලින්, සංවිධානවලින් හෝ ආයතනවලින් සහ ඒ සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාගෙන් තැනැත්තන්ගේ නාම යෝජනා කරන ලෙස ඉල්ලමින් කොමිෂන් සභාව විසින් දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය.

2. ඉහත (1) වන ශීර්ෂය යටතේ දැන්වීමක් පළ කිරීමෙන් පසු, ඒ සෑම තැනැත්තකු ම, මණ්ඩලයක් ම, සංවිධානයක් ම හෝ ආයතනයක් ම සහ දිසාපතිවරයා විසින්, මූල මණ්ඩලයට පත් කරනු ලැබීමට යෝග්‍ය යයි ඔවුන් අදහස් කරන සුදුසු තැනැත්තන්ගේ නම සහ වෙනත් විස්තර, නිර්දේශයන් ද සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

3. තැනැත්තකුගෙන්, මණ්ඩලයකින්, සංවිධානයකින් ආයතනයකින් හෝ දිසාපතිවරයාගෙන් නිර්දේශය ලැබුණු විට, සමථ කිරීමේ දක්ෂතා සහ උපක්‍රම පිළිබඳ මූලික අභ්‍යාස පාඨමාලාවක් හැදෑරීම සඳහා යෝග්‍ය යයි කොමිෂන් සභාව අදහස් කරන සුදුසු තැනැත්තන් කොමිෂන් සභාව විසින් තෝරා ගත යුතු ය.

4. ඉහත 3 වන ශීර්ෂයෙහි සඳහන් මූලික අභ්‍යාස නිම කිරීමෙන් පසු, පාඨමාලාව පවත්වන තැනැත්තා හෝ තැනැත්තන් විසින් එක් එක් අභ්‍යාසලාභියා සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඒ වාර්තාවෙහි සමථකාරවරයකු ලෙස ක්‍රියා කිරීමට ඒ අභ්‍යාසලාභියා සතු සහජ හැකියාව, ඇනුම සහ දක්ෂතා ගැන අදහස් දක්වා තිබිය යුතු ය.

5. ඉහත 4 වන ශීර්ෂයෙහි සඳහන් වාර්තාව ලැබුණු විට, කොමිෂන් සභාව විසින් ඒ වාර්තාව සලකා බැලීමෙන් පසු, සෑම සමථ මණ්ඩල ප්‍රදේශයක් සඳහා—

(1) ඒ සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් නාමයෝජනා කරන ලද රජයේ නිලධරයන්ගෙන් පස් දෙනකුට නොවැඩි සංඛ්‍යාවක් ඇතුළත් විය හැකි දොළොස් දෙනකුට නො අඩු සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයක් ;

(2) ඒ මූල මණ්ඩලයට කලින් කල අවශ්‍ය යයි සලකනු ලබන අතිරේක සාමාජිකයන් සංඛ්‍යාවක් ;

(3) මූල මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා අවශ්‍ය වන සාමාජිකයන් සංඛ්‍යාවක්

පත් කරනු ලැබිය යුතු ය.

6. මූල මණ්ඩලයේ සභාපතිවරයා ලෙස එහි සාමාජිකයන් අතුරින් එක් තැනැත්තකු කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

7. සභාපතිවරයා හැර මූල මණ්ඩලයට පළමුව පත් කරනු ලබන සාමාජිකයන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විසින් පළමුවන වර්ෂය අවසානයේ දී ධුර හිස් කළ යුතු අතර, තුනෙන් එකක් විසින් දෙවන වර්ෂය අවසානයේ දී ධුර හිස් කළ යුතු ය. සාමාජිකයන් සංඛ්‍යාවෙන් තුනෙන් එක පූර්ණ සංඛ්‍යාවක් හා භාගයක් වන විට, ඒ පූර්ණ සංඛ්‍යාව හා භාගයට ඉහළින් ඇති පූර්ණ සංඛ්‍යාව මේ ඡේදයේ

කාර්යය සඳහා තුනෙන් එක ලෙස සැලකිය යුතුය. ඒ එක් එක් වර්ෂය අවසානයේ දී ධුර හිස් කළ යුතු සාමාජිකයන් කවුරුන් ද යන බව මූල මණ්ඩලයේ සභාපතිවරයා විසින් කුසපත් ඇදීමෙන් තීරණය කරනු ලැබිය යුතු අතර, ඒ තීරණය සභාපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු ය. ඉතිරි සාමාජිකයන් විසින් තුන් වන වර්ෂය අවසානයේ දී සිය ධුර හිස් කළ යුතු ය.

8. ඉහත 7 වන ශීර්ෂයෙහි සඳහන් එක් එක් වර්ෂය අවසානයේ දි ඇතිවන පුරප්පාඩු පිරවීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය වන පරිදි පත්වීම් කරනු ලැබිය හැකි අතර එසේ පත් කරනු ලැබූ සෑම තැනැත්තකු ම ඉනික්බිති වර්ෂ තුනක කාලයක් ධුර දැරිය යුතු ය.

9. (1) ඉහත 7 වන ශීර්ෂය යටතේ හෝ සිය ධුර කාලය ඉකුත්වීම නිසා හෝ ධුරය හිස් කරන සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු විසින් සිය ධුරය හිස් කරන දිනයේ දී, යම් කරුණක් විභාග කරමින් සිටින අවස්ථාවක, ඔහුගේ ධුරය හිස් කිරීම, ඔහු ඒ විභාගය අවසාන් කරන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

(2) ධුරය හිස් කරන සාමාජිකයකුගේ අනුප්‍රාප්තිකයා වශයෙන් යම් හේතුවක් නිසා තැනැත්තකු පත් කර නොමැති අවස්ථාවක, එම ධුරය හිස් කරන සාමාජිකයා, සිය අනුප්‍රාප්තිකයා පත් කරනු ලබන තෙක් හෝ කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයෙන් තීරණය කරන තෙක්, මූල මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් දිගටම සිටිය යුතු ය.

(3) තම ධුර කාලය ඉකුත් වීම නිසා ධුරය හිස් කරන මූල මණ්ඩලයේ සභාපතිවරයා හෝ යම් සාමාජිකයෙක් හෝ නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

10. (1) (අ) සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට තමා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය ;

(ආ) කොමිෂන් සභාව විසින් හේතුවක් නොදක්වා සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(2) ධුරයෙන් ඉල්ලා අස් වූ හෝ ඉවත් කරනු ලැබූ සභාපතිවරයෙක් හෝ යම් සාමාජිකයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය.

11. සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු තම ධුර කාලය ඉකුත්වීමෙන් නොව වෙනත් හේතුන් නිසා තම ධුරය හිස් කළහොත්, සභාපතිවරයා සම්බන්ධයෙන් වන විට, ඔහු වෙනුවට කොමිෂන් සභාව විසින් වෙනත් යම් සුදුසු තැනැත්තකු, ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා ධුරය දැරීමට පත් කළ යුතු අතර, සාමාජිකයකු සම්බන්ධයෙන් වන විට ඔහු වෙනුවට කොමිෂන් සභාව විසින් වෙනත් යම් සුදුසු තැනැත්තකු ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා ධුරය දැරීමට පත් කරනු ලැබිය හැකි ය.

12. මේ පනත යටතේ කාර්තව්‍යයන් කිරීම වෙනුවෙන් මූල මණ්ඩලයේ සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට කිසිදු පාරිශ්‍රමිකයක් ලැබීමට හිමිකම් නැත්තේ ය.

## දෙවන උපලේඛනය [7(1) (ඇ) වගන්තිය]

| I තීරය<br>වරද | II තීරය<br>දණ්ඩ නීති සංග්‍රහයේ<br>අදාළ වගන්ති |
|---|---|
| කලහ කිරීම ... ... ... | 157 |
| ස්වේච්ඡාවෙන් තුවාල කිරීම ... ... | 314, 315, 325 |
| ස්වේච්ඡාවෙන් බරපතල තුවාල කිරීම හෝ ප්‍රකෝප කරනු ලැබ බරපතල තුවාල කිරීම ... ... ... | 316, 326 |
| ජීවිතයට අන්තරායකර ක්‍රියාවක් මගින් තුවාල කිරීම ... | 323 |
| මනුෂ්‍ය ජීවිතයට හෝ අනිකුත් අයගේ පුද්ගල ආරක්ෂාවට අන්තරායකර ක්‍රියාවක් මගින් බරපතල තුවාල කිරීම ... | 329 |
| යම් තැනැත්තකුට අයුතු ලෙස අවහිර කිරීම හෝ යම් තැනැත්තකු අයුතු ලෙස හිරකර තැබීම ... ... | 332, 333 |
| අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධ බලහත්කාරය ... | 343, 346, 348, 349 |
| පුද්ගලික තැනැත්තකුට අලාභය වනසේ දේපළ වංකලෙස වැපහරණය කිරීම — — | 386 |
| පුද්ගලික තැනැත්තකුට යම්කිසි අලාභ හෝ හානි සිදුවන සේ අනර්ථය කිරීම ... ... ... | 409, 410 |
| පුද්ගලික තැනැත්තකුට අලාභය වන සේ රුපියල් දහයක වටිනාකම ඇති යම් සතකු මැරීමෙන් හෝ අංග විකලත්වයට පත් කිරීමෙන් අනර්ථය කිරීම ... ... ... | 411 |
| පුද්ගලික තැනැත්තකුට අලාභ වන සේ හරකුන් ආදිය මැරීමෙන් හෝ අංග විකලත්වයට පත් කිරීමෙන් අනර්ථය කිරීම ... | 412 |
| සාපරාධී අයුතු ඇතුළුවීම ... ... ... | 433 |
| ගෙයකට අයුතු ලෙස ඇතුළුවීම ... ... | 434 |
| අපකීර්තිකරණය ... ... ... | 480 |
| යම් දෙයක් අපකීර්තිකර බව දැන එය මුද්‍රණය කිරීම හෝ කැටයම් කිරීම ... ... ... ... | 481 |
| අපකීර්තිකර කරුණක් ඇතුළත් බව දැන එවැනි කරුණක් ඇතුළත් මුද්‍රණය කරනු ලැබූ හෝ කැටයම් කරනු ලැබූ දෙයක් විකිණීම | 482 |
| සාමය කඩ කිරීමට තුඩු දෙන ප්‍රකෝපනය කිරීමේ චේතනාවෙන් නින්දා කිරීම ... ... ... | 484 |
| සාපරාධී භය ගැන්වීම ... ... ... | 486 |

## තුන්වන උපලේඛනය [7(1) (ආ) වගන්තිය]

1. විවාහ ආරවුල්වලට අදාළ නඩු.

2. සිහි විකල, බාලවයස්කාර සහ රක්ෂිත තැනැත්තන්ට සහ එම තැනැත්තන්ගේ මුදල්වලට අදාළ නඩු.

3. භාරකරුවන්ට, දේපළ ආරක්ෂකයන්ට සහ දේපළ භාර ගන්නන්ට අදාළ නඩු.

4. භාරවලට අදාළ නඩු.

5. දරුකමට හදාගැනීමේ ආඥාපනත යටතේ දරුකමට හදා ගැනීම සඳහා වූ ඉල්ලීම්වලට අදාළ නඩු.

6. උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ කරන ලද ඉල්ලීම්වලට අදාළ නඩු.

7. බෙදුම් නඩු.

8. තෙස්තමේන්තු නඩු.

9. වස්තු භංගත්ව ආඥාපනත යටතේ නඩු.

10. අද්මිරාල්ති නඩු.

11. ඡන්ද පෙත්සම්වලට අදාළ නඩු.

12. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව යටතේ වූ ඉල්ලීම්වලට අදාළ නඩු.

13. මේ පනත ආරම්භ වන දිනයෙහි ණය සහනාදායක මණ්ඩලය ඉදිරියේ විභාගයට භාජනව තිබුණා වූ හෝ බේරුම් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම හෝ මගින් ණය සහනාදායක මණ්ඩලය විසින් කටයුතු කර අවසන් කර තිබෙන්නා වූ හෝ ඉල්ලීම්වලට අදාළ නඩු.

14. උකස් පනත යටතේ නඩු.

15. පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කිරීම්වලට අදාළ නඩු.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.